# ඉඟුරුවත්ත කොටවෙහෙර ටැම්පිට විහාරයේ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ හා එහි වර්තමාන තත්ත්වය පිළිබඳ අධ්‍යයනයක්

ජී.ජී.එච්.එස්. වීරවංශ[1]

ප්‍රමුඛ පදः ටැම්පිට විහාරය, වාස්තු විද්‍යාව, ප්‍රතිමාගෘහය

**හැඳින්වීම**

ටැම්පිට විහාර යනු ශ්‍රී ලංකාවේ අද්විතීය අංගයකි. මෙම සම්ප්‍රදාය මහනුවර යුගයේ ක්‍රිස්තු වර්ෂ 16-19 සියවස් අතර ආරම්භ වී ඇති අතර ටැම් හෙවත් කුළුණු මත ගොඩනැංවූ ප්‍රතිමා ගෘහ සහිත විහාරයක් ලෙස පෙන්වාදිය හැකිය. සාධකවලට අනුව මෙම දෙමහල් පිළිම ගෙවල් ඉහළ මහල තුළ ධාතූන් වහන්සේ ද පහළ මහලේ පිළිම වහන්සේලා තැන්පත් කර තිබේ. පසුකාලීනව මහනුවර යුගයේ දළදා මාලිගාවේ ද ධාතුව ඒ අනුව තැන්පත් කර තිබීමෙන් පැහැදිලි වේ. මෙය නිර්මාණයේ දී කෙටි ගල් කණු මත දැව බාල්ක හරස් කර නිර්මාණය කර තිබීම දක්නට ලැබෙන අතර මේ ආකාරය අම්බලම් හා වී අටුවා යන වාස්තු විද්‍යා අංග ද ඉදිකර තිබේ. මෙලෙස තනන ලද පැරණි කුඩා අටු හෝ බී හි යට ඇති ඉඩ වැස්සට නොතෙමෙන අතර අව්වෙන් ද ආරක්ෂා වේ. තවද කුඩා විහාර මන්දිරයකට ගාම්භීර පෙනුමක් ලබාදීමට ද මෙලෙස උස් ගල්කණු මත ඉදිකරන්නට ඇති බවට තවත් අදහසකි. මේ අනුව ස්වභාවික ආපදා, කෘමීන්ගෙන් සිදුවන හානි, මහල් දළදා මැදුරුවල බලපෑම් නිසාවෙන් මෙම ටැම්පිට විහාර සම්ප්‍රදාය ආරම්භ වීමට හේතු වී තිබේ. දිවයින පුරා සුවිශේෂී වාස්තු විද්‍යාත්මක ලක්ෂණවලින් යුතු ටැම්පිට විහාර දැකගත හැකි අතර ඉඟුරුවත්ත කොටවෙහෙර ටැම්පිට විහාරය එලෙස බිහි වූ විහාරයකි. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඟුරුවත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටා තිබෙන ඉඟුරුවත්ත කොටවෙහෙර ටැම්පිට පුරාණ විහාරයේ ඇති ටැම්පිට ප්‍රතිමාගෘහය කීර්ති ශ්‍රී රාජසිංහ සමයේ නිර්මාණය කර ඇති බවට සැලකේ. මහනුවර යුගයට අයත් මෙම විහාරස්ථානයේ වැලිවිට සරණංකර සංඝරාජ හිමියන් විසින් රෝපණය කරන ලද බෝධියක් ද දක්නට ලැබේ. මෙම විහාරයේ ටැම්පිට විහාරයට සමකාලීනව ඉදිකරනු ලැබූ පුරාණ ධර්ම ශාලාවට ඉදිරියෙන් මෙම ටැම්පිට ප්‍රතිමා ගෘහය ඉදිකර තිබේ. මේ තුළ මහනුවර යුගයට අයත් ගෘහ නිර්මාණ ශිල්පය, චිත්‍ර කලාව යනාදී ලක්ෂණවලින් හෙබි වාස්තු විද්‍යාත්මක ලක්ෂණ මනාව ඉස්මතු කර තිබේ.

ඒ අනුව මෙහි දී මහනුවර යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය, චිත්‍ර ශිල්පය යනාදිය මනාව ඉස්මතු කර පෙන්වන ඉඟුරුවත්ත කොටවෙහෙර ටැම්පිට විහාරයේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ හා එහි වර්තමාන තත්ත්වය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ.

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
hansisaummya@gmail.com

**ක්‍රමවේදය**

මෙය ගුණාත්මක පර්යේෂණයකි. මෙහි දී දත්ත රැස් කිරීමේ පර්යේෂණ ක්‍රමවේද ලෙස ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර ගවේෂණය හා ක්ෂේත්‍ර නොවන ගවේෂණය ක්‍රම ප්‍රයෝජනයට ගනු ලැබීය. පුස්තකාල ගවේෂණය හරහා පසුබිම් සහ සන්දර්භීය තොරතුරු රැස් කරන ලදී. ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා ක්ෂේත්‍ර ගවේෂණයේ දී ඉඟුරුවත්ත කොටවෙහෙර ටැම්පිට විහාරයේ ප්‍රතිමා ගෘහය පිළිබඳ ඍජු නිරීක්ෂණය සහ සවිස්තරාත්මක වාස්තු විද්‍යාත්මක අධ්‍යයනයක් කරන ලදී. ගුණාත්මක අවබෝධයක් රැස් කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා මඟින් මේ පිළිබඳ ව තොරතුරු ලබා ගැනීම ද සිදු කරන ලදී.

**ප්‍රතිඵල හා සාකච්ඡා**

ඉඟුරුවත්ත ටැම්පිට විහාරය ආනතිය සහිත භූමියක පිහිටා තිබෙන අතර එය සමතලා කොටස සකසා ගත් බිමක උතුරු දිශාවට දිශානුගතවන ආකාරයට චතුරස්‍රාකාර හැඩයට ලෙස අඩි 2 අගල් 4කින් උස් වූ ගල් කණු 8ක්, ලම්භකව සිටුවා ඇති අතර ඒවා පොළොවේ ගිලා බැසීම වළක්වා ගැනීම සඳහා ගල් පුවරුවලින් සැකසූ අත්තිවාරමක සකසා තිබේ. මෙම ගල් ටැම් අට මත දිග අඩි 9 හා පළල අඩි 8ක් වූ විශාල දැව බාල්ක යොදා දැව තට්ටුවක් මත මෙම තනි මහල් ටැම්පිට විහාරය ඉදිකර තිබේ. මෙහිදී ප්‍රධාන කුළුණු හතර හා කෝණ කුළුණු හතරෙන් සකස් වන සීමාවේ ගර්භ ගෘහය වරිච්චි බිත්ති යොදා සකස් කර තිබේ. මෙහි බිත්තිවල කෝණවලට සකස් නොකරන ලද අරටු දැව භාවිත කර තිබේ. එමෙන්ම මෙහි ප්‍රතිමාගෘහය වටා වරිච්චි බිත්තිවලින් බැඳ ප්‍රදක්ෂිණා පථය පිහිටා තිබේ. ටැම්පිට විහාරයේ වහලය නිර්මාණයේදී වරිච්චි බිත්ති මත දැවරාමුවක් ඉදිකර එය දැව බක්ක ක්‍රමයට කට්ට කපා වැද්දීම සිදුකර තිබෙන අතර මෙහි දී වහලයේ දැව රාමුව හා යට ලී රාමු අතර කොටිකාවත නම් විශේෂ දැවමය අංගය යොදා තිබේ. පල හතරකින් යුතු පියස්සේ පෙති උළු සෙවිලි කර තිබෙන අතර මැටිකොත් ද්වත්වයකින් යුක්ත වේ. එමෙන්ම ටැම්පිට විහාරයේ ප්‍රතිමා ගෘහයට පිවිසීමට කෙටි දැව තරප්පු පෙළකින් යුක්ත අතර එය හේවිසි මණ්ඩපයට සම්බන්ධ කර තිබෙන එහි බිරළු වැටකින් අලංකාර කර තිබේ. මෙහි ප්‍රතිමාගෘහය ඇතුළත මෙන්ම පිටත බිත්තිවල අලංකාර සිතුවම ඇඳ වලිත්තියක් ද ගා තිබේ. මහනුවර සිතුවම් කලාවේ ලක්ෂණ සහිතව ඇතුළත බිත්තිවල ලියවැල්, මල් මෝස්තර, දෙවිවරුන්ගේ රූප මෙන්ම සත් සතියේ අවස්ථා ද නිරූපණය කර තිබේ. පිටත බිත්තිවල අපාය නිරූපණය කරමින් සිතුවම් කර තිබේ.

මෙලෙස ඉතා සුවිශේෂී වාස්තු විද්‍යාත්මක ලක්ෂණ රැසකින් සමන්විත ඉඟුරුවත්ත පුරාණ විහාරයේ ටැම්පිට ප්‍රතිමාගෘහය වර්තමානය වන විට නිසි නඩත්තුවක් නොමැති වීම නිසා හායනයට ලක්ව තිබේ. මෙහි වහලයේ පැරණි පෙති උළු වෙනුවට නව උළු සෙවිලි කර තිබෙන අතර හේවිසි මණ්ඩපය බිම් ගල් අතුරා තිබේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මෙහි සංරක්ෂණ කටයුතු කර

තිබුණ ද අඛණ්ඩ නඩත්තු ක්‍රියාවලියක් සිදුවී නොමැති බව පෙනේ. ප්‍රතිමාගෘහයේ වහලය දිරාපත් වී තිබෙන අතර බිත්ති ඉරි තැලීම, බිතු සිතුවම්වල පතුරු ගැලවී තිබීම හා බදාම ස්ථර ගැලවී ගොස් තිබීම මෙන්ම ප්‍රතිමාගෘහයේ ඉදිරිපස දොරටුපාල ප්‍රතිමා දෙකෙහි දූවිලි බැඳ දුර්වර්ණ වීම ආදි හානිදායක තත්ත්ව දැකිය හැකිය. ප්‍රතිමා ගෘහයේ පිටත බිත්තියේ ඇඳ ඇති සිතුවම් මත හුණු ආලේප කර තිබීමෙන් මෙන්ම ඇතුළත බිත්තිවල සිතුවම් මිනිසුන් ස්පර්ශ කිරීමෙන් එම සිතුවම් විනාශයට ලක්ව ඇති බව පෙනේ. ඒ අනුව පාරිසරික මෙන්ම මානව ක්‍රියාකාරකම් නිසාවෙන් මෙන්ම නිසි පුරාවිද්‍යාත්මක නඩත්තුවක් නොමැති වීම නිසාවෙන් විනාශයට ලක් වෙමින් පවතින බව පෙනේ.

## සමාලෝචනය

යථෝක්ත කරුණුවලින් අනාවරණය වන පරිදි වාස්තු විද්‍යාත්මක ලක්ෂණවලින් යුතු මෙම පුරාණ ටැම්පිට විහාරය සඳහා විධිමත් සංරක්ෂණ ක්‍රියාවලියක් හා නඩත්තු ක්‍රියාවලියක් සකස් කර අනාගතය උදෙසා රැක ගැනීම බලධාරීන්ගේ ප්‍රධාන අවශ්‍යතාවක් ලෙස හඳුනා ගත හැක.

## ආශ්‍රිත මූලාශ්‍රය

අනුරාධා. ආර්.කේ.එස්, අජන්තා සමන් කුමාරි, (2020). ***පෞරාණික ස්ථාන හා ස්මාරක කුරුණෑගල දිස්ත්‍රික්කය***. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

විජයවර්ධනය, කුසුම්සිරි. (2010). ***ශ්‍රී ලංකාවේ ටැම්පිට විහාරය***. දයාවංශ ජයකොඩි සහ සමාගම.

**සම්මුඛ සාකච්ඡා**

වික්‍රමසිංහ, පී.පී. (2025). ඉඟුරුවත්ත ටැම්පිට විහාරය. ජී.ජී.එච්.එස්. වීරවංශ, 2025/07/07.